## මාධ්‍ය නිවේදනය

**අ.පො.ස. ( උසස් පෙළ) විභාගය - 2021(2022)**

**2022.04.03 දිනට නියමිත ප්‍රායෝගික පරීක්ෂණ තාවකාලිකව නොපැවැත්වීම**

උක්ත සඳහන් විභාගයේ 2022.03.29 වන දින ආරම්භ කරන ලද පහත සඳහන් නර්තන හා සංගීත විෂයයන්හි ප්‍රායෝගික පරීක්ෂණ රටතුළ බල පැවැත්වෙන ඇදිරිනීති තත්ත්වය හේතුවෙන් **2022.04.03 වන ඉරිදා දින පමණක්** නොපැවැත්වෙන බව ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩල සාමාජිකයන් හා විභාග අපේක්ෂකයන් හට මෙයින් නිවේදනය කරමි.

| විෂය අංකය | විෂය | විෂය අංකය | විෂය |
|---|---|---|---|
| • 52 | නර්තනය (දේශීය) | • 53 | නර්තනය(භරත) |
| • 54 | පෙරදිග සංගීතය | • 55 | කර්නාටක සංගීතය |
| • 56 | බටහිර සංගීතය | | |

2) **2022.04.03 වන දින ප්‍රායෝගික පරීක්ෂණ සඳහා ඉදිරිපත් වීමට නියමිතව සිටි අපේක්ෂකයින් 2022.04.04 වන දින පරීක්ෂණ මණ්ඩලය වෙත පැමිණ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නැවත දිනයක් ලබාගන්නා ලෙස ද මෙයින් වැඩිදුරටත් දන්වමි.**

3) එම මණ්ඩලය විසින් පරීක්ෂණ පැවැත්වීමේ අවසන් දිනය හෝ ඊට පසු දින වේලාවක් ඔබ වෙත ලබා දෙනු ඇති අතර **මෙම නැවත දිනයක් නිකුත් කිරීම 2022.04.03 දිනට නියමිත අපේක්ෂකයන් සඳහා පමණක් වලංගු වන බව ද තරයේ අවධාරණය කරමි.**

4) **2022.04.04** වන සඳුදා දින සිට නියමිත පරිදි ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් එදින සිට ඉදිරි දිනයන්හි දී ප්‍රායෝගික පරීක්ෂණ සඳහා වේලාවන් ලැබී ඇති විභාග අපේක්ෂකයින් තමන්ට නියමිත දින නියමිත වේලාවට අදාළ ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය වෙත වාර්තා කරන ලෙස ද මෙයින් නිවේදනය කරමි.

එල්. එම්. ඩී. ධර්මසේන
විභාග කොමසාරිස් ජනරාල්

# ஊடக அறிவித்தல்

## கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர)ப் பரீட்சை – 2021(2022)

## 2022.04.03 திகதிக்குரிய செய்முறைப் பரீட்சைகளை தற்காலிகமாக இடைநிறுத்தல்

2022.03.29 ஆம் திகதி தொடங்கி நடைபெற்றுக் கொண்டிருக்கின்ற மேற்படி பரீட்சையின் பின்வரும் பாடங்களுக்குரிய செய்முறைப் பரீட்சை நாட்டில் அமுல்படுத்தப்பட்டுள்ள ஊரடங்குச் சட்டம் காரணமாக **2022.04.03 ஆம் திகதி ஞாயிற்றுக்கிழமை மட்டும்** நடைபெற மாட்டாது என்பதை செய்முறைப் பரீட்சைக் குழுவினருக்கும் பரீட்சார்த்திகளுக்கும் இத்தால் அறியத் தருகின்றேன்.

| பாட எண் | பாடம் |
|---|---|
| 52 | நாட்டியம் (தேசிய) |
| 53 | நாட்டியம் (பரதம்) |
| 54 | கீழைத்தேய சங்கீதம் |
| 55 | கர்நாடக சங்கீதம் |
| 56 | மேலைத்தேய சங்கீதம் |

2) **2022.04.03** ஆம் திகதி செய்முறைப் பரீட்சைக்குத் தோற்றவிருந்த பரீட்சார்த்திகள் **2022.04.04** ஆம் திகதி திங்கட்கிழமை தமக்குரிய பரீட்சை குழுவிற்கு சமூகமளித்து தமது செய்முறைப் பரீட்சைக்கான திகதியையும் நேரத்தையும் மீண்டும் பெற்றுக் கொள்ள வேண்டும் என்பதை மேலும் அறியத்தருகின்றேன்.

3) உங்களுக்குரிய பரீட்சைக் குழுவினால் செய்முறைப் பரீட்சைக்குழு முடிவடையும் தினத்திலோ அல்லது அதற்கு அடுத்த தினத்திலோ உங்களுக்குரிய நேரம் வழங்கப்படும் என்பதுடன் **இம் மறு திகதி 2022.04.03 ஆம் திகதிக்குரிய பரீட்சார்த்திகளுக்கு மட்டுமே செல்லுபடியாகும்** என்பதையும் கவனத்திற் கொள்ளவும்.

4) 2022.04.04 ஆம் திகதியிலிருந்து ஏலவே ஒழுங்கமைக்கப்பட்டுள்ளவாறு செய்முறைப் பரீட்சை நடவடிக்கைகள் தொடரும் என்பதால் அத்தினத்திலிருந்து பரீட்சார்த்திகள் தமக்குரிய தினத்தில் தமக்குரிய நேரத்திற்கு உரிய குழுவிற்கு செய்முறைப் பரீட்சைக்கு சமூகமளிக்குமாறு இத்தால் அறியத் தருகின்றேன்.

எல்.எம்.டீ.தர்மசேன

பரீட்சை ஆணையாளர் நாயகம்